චක්‍රලේඛ අංක :- 2003/11


ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත, කොළඹ 07
இல 7, கிரகரீஸ் வீதி, கொழும்பு 07
No.7, Gregory's Avenue, Colombo 07

ෆැක්ස් / Fax :
ඊමේල් / E-mail : Landcom


චක්‍රලේඛ අංක-2003/11

මගේ අංකය / எனது இல / MY NO : 5/2/6/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / YOUR NO :
දිනය / திகதி / DATE : 2003-

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රේඛාචිත්‍ර නිකුත් කිරීම හා දීමනාපත්‍ර අවලංගු කිරීම පිළිබඳ උපදෙස්</u>**

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ජයභූමි දීමනාපත්‍ර මගින් බෙදා දී ඇති ඉඩම් සඳහා රේඛාචිත්‍ර සකස් කිරීමට මැනුම් නියෝග කඩිනමින් නිකුත් කිරීම සඳහා දැනටමත් මවිසින් ඔබ වෙත දන්වා ඇත. මෙම මැනුම් නියෝග සම්බන්ධයෙන් මැනුම්පති විසින් ඔහුගේ ක්ෂේත්‍ර නිලධාරීන් වෙත නිකුත්කර ඇති ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ අංක 3(1) 2003 දරණ චක්‍රලේඛයෙන් ලබාගත් උද්ධෘතයක් පහත දක්වමි.

"ජයභූමි ඔප්පු නිකුත්කරන ලද එහෙත් මැනුම් කටයුතු නොකර ඇති ඉඩම්වල මැනුම් කිරීමේ දී අදාල ඉඩම් භාරකරු සහ ප්‍රදේශභාර ග්‍රාම නිලධාරී එම එක් එක් ඉඩම්වල මායිම් පෙන්වා දිය යුතු අතර එම දෙදෙනාම පැමිණ සිටීම අනිවාර්ය වේ. තවද එහි දී දෙපාර්තමේන්තු රෙගුලාසිවලට අනුව ප්‍රායෝගික ලෙස ප්‍රවේශ මාර්ග, රක්ෂිත බිම් තීරු යනාදිය සඳහා මැනුම් කටයුතු කළ නොහැකි අවස්ථා ඇති නම් එම තත්ත්වවලට අදාල මැනුම පිළිබඳව මිනින්දෝරුවරයාගේ යෝජනා ඇතුළත් අනුරේඛණයක් පිළියෙලකර විස්තර වාර්තාවක්ද සමඟ අදාල ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කරන්න. ඉතිරි ප්‍රදේශවල වැඩ නිමකර මැනුම් නියෝගය සම්පූර්ණ කළ හැක. අත්හරින ලද ප්‍රදේශ පිළිබඳව එම යෝජනා පිළිබඳ ඔහුගේ තීරණ ඇතුළත් මැනුම් නියෝගයක් එවන ලෙස ද ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවන්න. එය ලද විට මැනුම් කටයුතු කළ හැක."

මේ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ජයභූමි සඳහා රේඛාචිත්‍ර සකස් කරන ...වාවලදී එම ඉඩම් මුලින් මැන නොතිබීම නිසා සෑම ඉඩමකටම මාර්ග වැනි පොදු ...කම් සපයාදීම ගැටළුවක් බවට පත් වී ඇති අවස්ථා ඇත. එවැනි අවස්ථාවලදී මිනින්දෝරුඅධිකාරී විසින් ඊට අදාළ අනුරේඛණයක් සකස්කොට ඔබ වෙත ඉදිරිපත් කරනු ඇති අතර අදාළ පාර්ශවයන් කැඳවා පාරවල් හා අනෙකුත් පොදු අවශ්‍යතා සඳහා ඉඩම් වෙන්කළයුතු ආකාරය පිළිබඳව ඔබ විසින් තීරණයකොට එම තීරණ මිනින්දෝරුඅධිකාරී වෙත දැනුම් දිය යුතුය. ඒ අනුව මිනින්දෝරුඅධිකාරී විසින් එකී නියෝගය පරිදි කටයුතු කර මැනුම්කර රේඛාචිත්‍ර සකස්කරනු ඇත. යම් හෙයකින් ඔබට එම ගැටළුව නිරාකරණය කරගැනීමට නොහැකි වුවහොත් ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සහිතව පළාත් ඉඩම් කොමසාරිස් මගින් මා වෙත ඉදිරිපත් කරන්න.

මෙම මැනුම් නියෝග යැවීම සම්බන්ධයෙන් ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට සතුටුදායක නොවන බව පළාත් ඉඩම් කොමසාරිස්වරුන් විසින් මා වෙත එවා ඇති වාර්තා අනුව පෙනී යයි. එබැවින් මේ සම්බන්ධයෙන් ඔබගේ පුද්ගලික අවධානය යොමු කරනලෙස නැවත වරක් කාරුණාවෙන් දන්වමි. මෙම මැනුම් නියෝග යැවීම සම්බන්ධයෙන් ඔබගේ ප්‍රගතිය වාර්තා කිරීමේ දී දින 100 වැඩ සටහන යටතේ මවිසින් එවනු ලැබූ උපදෙස් අනුව නිකුත් කරන ලද මැනුම් නියෝග ගණන, කට්ටි ප්‍රමාණය හා ලද රේඛාචිත්‍ර සංඛ්‍යාවන් ඇතුළත් කිරීමට කාරුණාකර පියවර ගන්න.

මැනුම් නියෝග යැවීමේ දී එක් යායට පිහිටි ඉඩම් කැබලි සඳහා එක් මැනුම් නියෝගයක් උපලේඛණයක් සහිතව යැවීමට මගේ අංක 2003/02 චක්‍රලේඛයෙන් උපදෙස් දී ඇති අතර එම උපලේඛණ සකස්කර ගැනීමට කාලයක් ගතවන බවට පලාත් ඉඩම් කොමසාරිස්වරුන් විසින් මා වෙත දැනුම් දී ඇත. ඔබගේ විෂය ලිපිකරුවන්ට මේ සඳහා ප්‍රමාණවත් කාලයක් වැයකළ නොහැකි නම් ඒ සඳහා විකල්පයක් වශයෙන් ග්‍රාම නිලධාරිවරුන්, සමෘද්ධි නිලධාරීන් වැනි අයගෙන් සහාය ලබාගෙන හෝ මෙම කාර්යය කඩිනමින් කිරීමට කරුණාකර පියවර ගන්න.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර නිකුත්කර ඇති අවස්ථාවල දීමනාපත්‍රකරු හා කලත්‍රයා මියගියපසු ඉඩමට හිමිකම් ලබාගැනීමට උරුමකරුවන් කිසිවෙකු නැති අවස්ථාවලදී පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීම් සඳහා කටයුතු කළ හැක. එහෙත් මේ සඳහා නිශ්චිත වශයෙන් උරුමකරුවෙකු නැති බව තහවුරු කරගත යුතුය. ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් දැනට නොමැති බැවින් ගැසට්පත්‍රයේ හෝ ජාතික පුවත්පතක භාෂාත්‍රයෙන්ම දැන්වීමක් ප්‍රසිද්ධ කිරීම වඩාත් කාලෝචිත හා සුදුසු ක්‍රමය යැයි සිතමි. එබැවින් මින් ඉදිරියේදී පනතේ 104 වගන්තිය යටතේ දීමනාපත්‍රයක් අවලංගු කිරීමට ඇති අවස්ථාවලදී මේ සමග ඇති ආකෘතියේ ප්‍රකාර දැන්වීමක් භාෂා තුනෙන්ම සකස්කොට ගැසට්පත්‍රයේ පළ කිරීමට පියවර ගන්න. ප්‍රමාණවත් ප්‍රතිපාදන ඔබ වෙත ඇත්තේ නම් පුවත්පත්වල පළ කිරීම ද සුදුසු බව යෝජනා කරමි. එසේ දැන්වීම් පලකර නියමිත කාලය ඉක්මවා ගියපසු එම තොරතුරු පැහැදිලි කරමින් වාර්තාවක් අදාළ දීමනාපත්‍රයේ මුල් පිටපත ද සමග පලාත් ඉඩම් කොමසාරිස් මගින් මා වෙත එවූ පසු ජනාධිපතිතුමියගේ අනුමැතිය ඒ සඳහා ලබාගෙන ඔබ වෙත එවීමට මවිසින් ක්‍රියාකරනු ඇත.

එස්.ජේ.පතිරණ
ඉඩම් කොමසාරිස්.

පිටපත:- 1. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය.
2.මිණුම්පති.
3.පලාත් ඉඩම් කොමසාරිස්වරුන්.
4.නියෝජ්‍ය/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන්.